**කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව - 2021**

**------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

**------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පතනේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනයට 2015 හා ඉකුත් වර්ෂයේදී වැය කරන ලද රු.4,318,943 ක් හා සමාලෝචිත වර්ෂය තුල පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු රු.50,003 ක් වටිනා පුස්තකාල පොත් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි සංවර්ධනයට වැය කර තිබූ රු.3,913,008 ක් ඉඩම් ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | | |
| (ඇ) | ඉදිකිරීම් කර්මාන්ත 04 ක් සඳහා ගෙවිය යුතු රු.9,022,545 ක් හා විවිධ වියදම් රු.1,332,346 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | | |
| (ඈ) | ඉකුත් වර්ෂයේදී ණයහිමි ප්‍රතිපාදන සලස්වා තිබුණු රු.2,868,862 ක ණයහිමි ශේෂ නිරවුල් කිරීම සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | ඉකුත් වර්ෂයේදී ණයගැතියන් වශයෙන් දක්වා තිබූ කර්මාන්ත වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබුණු රු.499,242 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඊ) | වලකන්ද ප්‍රජා ජල ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු වියදම රු.1,402,909 ක් වුවද ණයහිමියන් යටතේ රු.2,204,419 ක් ප්‍රතිපාදන වෙන් කිරීම නිසා රු.801,510 ක් වැඩිපුර ප්‍රතිපාදන සලස්වා තිබුණි. | | |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලිපි ද්‍රව්‍ය තොගයේ වටිනාකම රු.83,957 ක් අඩුවෙන් ද, වීදි පහන් තොගය රු.8,400 වැඩියෙන් ද දැක්වීමෙන් වර්ෂය අවසානයට තොගය රු.75,558 ක් අඩුවෙන් දක්වා තිබුණි. | | |

**1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් එකතුව රු.3,994,858 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාල ශේෂයන් හා ඊට අදාල උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුව රු.482,702 ක අසමානතා පැවතුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | අදාල ශේෂවල වෙනස්කම් සඳහා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛන හා විස්තරාත්මක උපලේඛන යනාදී තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.988,096 ක් වූ ගිණුම් විෂයන් 05ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.515,070 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,866,801 ක් විය.

### 2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

**(අ) වරිපනම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් ඒකක සංඛ්‍යාව 565 ක් වූ අතර එයින් වරිපනම් ඒකක 219 කට අදාලව රු.715,156 ක හිඟ ශේෂයක් පැවතුණි | රටෙහි පවතින වර්තමාන තත්වය මත හිඟ මුදල් අය කර ගැනීමේ ගැටළුවක් පවතින බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 හා 2019 වර්ෂවලදී සභාවට ඉදිරිපත් කරන ලද ගොඩනැඟිලි අයදුම්පත් නාගරික සංවර්ධන රෙගුලාසි වලට අනුකූල නොවීම මත අනුමත කර නොතිබූ අතර, එම ගොඩනැඟිලි අයදුම්පත් පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී ගොඩනැඟිලි අයදුම්පත් 03 කට අදාලව ගොඩනැඟිලි ඉදිකර අවසන් කර හෝ ඉදිකරමින් තිබූ අතර, තවත් ගොඩනැඟිලි 09 ක් සංවර්ධන බලපත්‍ර ලබා ගැනීමකින් තොරව ඉදිකර තිබුණි. මෙම අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/ රෙගුලාසි ඇතුළත් 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ 02 වන උපලේඛනය ප්‍රකාරව රු.913,792 ක ගාස්තු අය කර ඉදිකිරීම් විධිමත් කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | අදාල ගොඩනැගිලි අයදුම්පත් සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කර ගාස්තු අය කර ඉදිකිරීම් විධිමත් කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |